21.6 ක් විය. මෙම අනුපාතය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගණුදෙනු අත්හැර ගණනය කළ විට මෙම වර්ෂ දෙක අතර සියයට 12.9 සිට සියයට 16 ක් දක්වා ඉහළ නැගුනි. සමස්ථ ණය සේවා ගෙවීම්, වෙළඳ භාණ්ඩ අපනයන හා සේවා ඉපැයුම් සහ විදේශයන්හි සේවය කරන්නන්ගේ ප්‍රේෂණවල අනුපාතයක් ලෙස ගත්කල එය 1982 දී සියයට 15.5 ක් වූ අතර 1983 දී සියයට 17.9 ක් විය.

## රාජ්‍ය මූල්‍ය කටයුතු

1982 වර්ෂයට වඩා සැළකිය යුතු ප්‍රගතියක් 1983 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය කටයුතුවලින් පෙන්නුම් කෙරින. වඩාත් වැදගත් වූයේ,වර්තන ගිණුමේ සමතුලිතතාවයක් සාක්ෂාත් කර ගන්නා අතරම, ප්‍රාග්ධන වියදම්වලින් සියයට 95 ක් දක්වා ප්‍රමාණයක් උද්ධමනකාරී නොවන මාර්ගයන්ගෙන් පියවා ගැනීමයි.

### සමස්ත රාජ්‍ය මූල්‍ය තත්ත්වය

අත්තිකාරම් ගිණුම් සඳහා කළ වියදම් ඇතුළත්ව වර්ෂය සඳහා වූ රජයේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 46,772 ක් වූ අතර, පසුගිය වසර හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 8,872 ක් නැතහොත් සියයට 23 ක වැඩිවීමක් එයින් පෙන්නුම් කෙරින. රජයේ මුළු වියදම් වර්ධනය වීමේ අනුපාතිකය සියයට එකකින් වැඩි වූ අතර, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් එහි කොටස සියයට 38 ක්ව ස්ථාවරව පැවතුණි. පසුගිය වසරේ අත්තිකාරම් ගිණුම් යටතේ සටහන් වූ රුපියල් දශ ලක්ෂ 879 ක ශුද්ධ ලැබීම් වෙනුවට මේ වසරේ රුපියල් දශ ලක්ෂ 1,120 ක ශුද්ධ ගෙවීමක් සටහන් විය. රුපියල් දශ ලක්ෂ 25,210 ක් වූ රජයේ ආදායම් ලැබීම් මගින් රුපියල් දශ ලක්ෂ 7,401 ක් නැතහොත් සියයට 42 ක සැළකිය යුතු ආදායම් වර්ධනයක් වූ අතර, එය වර්තන ගිණුමේ රුපියල් දශ ලක්ෂ 132 ක අතිරික්තයක් ඇති වීමට සහ එමගින් මුළු ආයෝජන සම්පත්වලින් කොටසක් සපයනු ලැබීමට හේතු විය. ප්‍රාග්ධන වියදම්වල ප්‍රමාණය සියයට 16 ක වැඩිවීමක් සහිතව රුපියල් දශ ලක්ෂ 21,694 කට සීමාවිය. පසුගිය වසරේදී ප්‍රාග්ධන වියදම්වල වැඩිවීම සියයට 40 ක් විය. අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 21,562 ක් වූ අතර, එය දළ ජාතික නිෂ්පාදිතයේ කොටසක් වශයෙන් සියයට 18 ක් විය. පසුගිය වසරේදී අයවැය හිඟය දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතිකයක් වශයෙන් සියයට 20 ක් විය.

අයවැය හිඟය දේශීය හා විදේශීය මූලයන්ගෙන් ලබාගත් සම්පත් මගින් පියවා ගන්නා ලදී. හිඟයෙන් සියයට 51 ක් විදේශීය මූලයන්ගෙන් පියවා ගන්නා ලද අතර, මෙම ප්‍රමාණය 1982 දී සියයට 44 ක් විය. ඉලක්ක කරගනු ලැබූ රුපියල් දශ ලක්ෂ 14,024 ක් වෙනුවට ලැබූ මුළු විදේශීය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10,902 ක් විය. ව්‍යාපෘති ණය, භාණ්ඩ ණය සහ වෙනත් ණය යටතේ පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5,150 ක්, රුපියල් දශ ලක්ෂ 1,467 ක් සහ රුපියල් දශ ලක්ෂ 860 ක් ලැබුණු අතර, දීමනා වශයෙන් ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,425 ක් විය.

දේශීය සම්පත් අතුරින් බැංකු නොවන වෙළෙඳ පොළ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,762 ක් විය. වෙළෙඳ පොළින් පරිබාහිරව බැංකු නොවන මූලයන්ගෙන් ලබාගත් ණය රුපියල් දශ ලක්ෂ 2,389 ක් විය. සමස්ත අයවැය හිඟය පියවීම සඳහා මෙසේ ලබාගත් සියළුම සම්පත් ප්‍රමාණවත් නොවූ නිසා රුපියල් දශ ලක්ෂ 1,203 ක මුදලක් බැංකු අංශයෙන් ලබා ගැනීමට සිදු විය. රුපියල් දශ ලක්ෂ 36 ක රුපියල් ණය ආපසු ගෙවීම සහ රුපියල් දශ ලක්ෂ 694 ක මුදල් ශේෂ වැඩිවීම් සහිතව වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතුවලින් ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම් රුපියල් දශ ලක්ෂ 473 ක් විය.

1983 වසර සඳහා වන රාජ්‍ය මූල්‍ය කටයුතුවල සම්පිණ්ඩනයක් 1.47 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ඉකුත් වසර නවය සඳහා සංසන්දනාත්මක දත්තයන් සමඟ 1983 වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතු නිසා ඇතිවූ ශුද්ධ මූල්‍ය හිඟය සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටයේ දක්වා ඇත.

## 1 · 47 සංඛ්‍යා සටහන

## රාජ්‍ය මූල්‍ය කටයුතු 1980 – 1983

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1980 | 1981 | 1982 | 1983 අනුමත කළ ඇස්තමේන්තු | 1983 තාවකාලික * |
|---|---|---|---|---|---|
| 1. ආදායම (අ) | 14,068 | 16,228 | 17,809 | 25,734 | 25,210 |
| 2. වර්තන වියදම | 13,249 | 16,005 | 20,110 | 25,463 | 23,958 |
| 3. අත්තිකාරම් ගිණුම් කටයුතු (ලැබීම් + / ගෙවීම් – ) | – 3,240 | – 1,716 | + 879 | – 525 | – 1,120 |
| 4. වර්තන ගිණුම (අතිරික්තය + / හිඟය – ) | – 2,421 | – 1,493 | – 1,422 | – 254 | + 132 |
| 5. ප්‍රාග්ධන වියදම | 13,854 | 13,373 | 18,669 | 23,131 | 21,694 |
| එයින්: නිදන් අරමුදල්, ණය ආපසු ගෙවීම් සහ ජාත්‍යන්තර මූල්‍ය සංවිධානවලට ගෙවන ලද දායක මුදල් (ඇ) | (1,810) (ආ) | (1,608) (ආ) | (2,612) (ආ) | (5,183) | (5,302) (ආ) |
| 6. අයවැය හිඟය | 16,274 | 14,866 | 20,091 | 23,385 | 21,562 |
| 7. හිඟය පියවීම | | | | | |
| 7·1 දේශීය මූලයන් | 9,610 | 6,696 | 11,613 | 9,361 | 11,354 |
| (අ) බැංකු නොවන වෙළෙඳ පොළ ණය ගැනීම් | 2,700 | 2,379 | 5,894 | 8,000 | 7,762 |
| (ආ) වෙළෙඳපොල නොවන ණය ගැනීම් (ඈ) | – 216 | 400 | 1,713 | — | 2,389 |
| (ඇ) බැංකු ක්‍රමය | 7,126 (ඉ) | 3,917 (ඉ) | 4,006 (ඉ) | 1,361 | 1,203 (ඉ) |
| 7·2 විදේශීය මූලයන් | 6,735 | 8,208 | 8,794 | 14,024 | 10,902 |
| (අ) භාණ්ඩ ණය | 1,431 | 1,722 | 1,355 } | | 1,467 |
| (ආ) ව්‍යාපෘති ණය | 1,171 | 2,064 | 3,227 } | 14,024 | 5,150 |
| (ඇ) අනෙකුත් ණය | 1,513 | 1,701 | 836 } | | 860 |
| (ඈ) දීමනා | 2,620 | 2,721 | 3,376 } | | 3,425 |
| 7·3 මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම | – 72 | – 38 | – 315 | — | – 694 |
| 8. රාජ්‍ය මූල්‍ය කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම | 7,029 | 3,847 | 3,675 | 1,361 | 473 |

මූලයන්: මහා භාණ්ඩාගාරය,
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) විදේශීය දීමනා යටතේ දක්වන ලද, ප්‍රාග්ධන දීමනා ආදායමෙහි ඇතුළත් නැත.

(ආ) 1980 දී රුපියල් දශ ලක්ෂ 271 ක් ද, 1981 දී රුපියල් දශ ලක්ෂ 37 ක් ද, 1982 දී රුපියල් දශ ලක්ෂ 49 ක් සහ 1983 දී රුපියල් දශ ලක්ෂ 146 ක්ද වූ විදේශීය පරිපාලන ණය ආපසු ගෙවීම් ඇතුළත් ය.

(ඇ) 1980 දී රුපියල් දශ ලක්ෂ 308 ක් සහ 1983 (තාවකාලික) දී රුපියල් දශ ලක්ෂ 277 ක්වූ ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන්ට ගෙවූ දායක මුදල් ඇතුළත් ය.

(ඈ) ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන්ට දායක මුදල් ගෙවීම සඳහා මහ බැංකුවෙන් ලබාගත් අත්තිකාරම් වූ, 1980 දී රුපියල් දශ ලක්ෂ 308 ක් සහ 1983 (තාවකාලික) දී රුපියල් දශ ලක්ෂ 277 ක් ඇතුළත් ය.

(ඉ) 1980 දී රුපියල් දශ ලක්ෂ 25 ක් ද, 1981 දී රුපියල් දශ ලක්ෂ 32 ක් ද, 1982 දී රුපියල් දශ ලක්ෂ 16 ක් සහ 1983 දී රුපියල් දශ ලක්ෂ 36 ක් ද වූ බැංකු ක්‍රමය වෙත ආපසු ගෙවන ලද රුපියල් ණය ඇතුළත් ය.

* අවසාන සැසඳීමක් කෙරෙන තුරු තාවකාලික භාණ්ඩාගාර දත්තයන් පදනම් කරගන්නා ලදී.

**ආදායම**

1983 වර්ෂයේ රජයේ ආදායම පසුගිය වසරට වඩා සියයට 42 ක තියුණු වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 25,210 ක් විය. මෙය ඉකුත් පස් වසර තුළ දී වාර්තාවූ ඉහළම වාර්ෂික වර්ධන වේගය විය. බදු ආදායම සියයට 34 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 20,700 ක් වූ අතර බදු නොවන ආදායම සියයට 89 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 4,510 ක් විය. බදු නොවන ආදායමෙහි ඇතිවූ තියුණු වැඩිවීමට මූලික වශයෙන් හේතු වූයේ මුදල් නීති පනතෙහි 39 වැනි ඡේදයට අනුව මහ බැංකුවේ ලාභ භාණ්ඩාගාරයට මාරු කිරීමය. බදු ආදායමෙහි වූ තියුණු වැඩිවීමට පිරිවැටුම් බදු, ආනයන බදු සහ තේ බදු වෙතින් වූ ඉහළ ලැබීම් හේතු විය. මහ බැංකුවේ ලාභ මාරු කිරීම රහිතව ගත් කල, මුළු ආදායම සහ බදු නොවන ආදායම, ඉකුත් වසරට වඩා පිළිවෙලින් සියයට 33 ක සහ සියයට 26 ක වැඩිවීම් පෙන්වීය.


දළ දේශීය නිෂ්පාදිතයෙහි නාමික වර්ධන වේගයට වඩා වැඩි අනුපාතයකින් රජයේ බදු ආදායම වැඩිවීම නිසා බදු ආදායම/දළ දේශීය නිෂ්පාදන අනුපාතිකය 1982 දී සියයට 15 සිට 1983 දී සියයට 17 දක්වා වැඩි විය. මෙය ඉකුත් වසර කීපය තුළදී පහළට නැඹුරුවී පැවැති එම උපනතියේ ආපසු හැරවීමක් විය. මෙම අනුපාතිකයේ ආපසු නැඹුරුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ආනයන වැඩි ප්‍රමාණයක් හසුවන සේ ආනයන බදු පුළුල් කිරීම මෙන්ම, ආනයන හා පිරිවැටුම් බදු අනුපාතිකයන් වැඩි කිරීම නිසා ආදායමේ වැඩිවීමත්, ඉහළ මිල ගණන් නිසා තේ සහ රබර්වලින් ඉහළ ආදායමක් ලැබීමත් ය. රජයේ බදු ආදායම් ලැබීම්හි ඇතිවූ මෙම ප්‍රගතිය, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව බදු ආදායම දක්වූ සංවේදිතා සංගුණකයෙහි වැඩිවීමෙන් ද පිළිබිඹු වූ අතර එය තාවකාලික ගණනයන්ට අනුව 1982 දී 0.479 සිට 1983 දී 1.545 දක්වා ඉහළ නැගුණි. ඉහළ නංවන ලද බදු අනුපාතිකයන් හා වැඩිපුර අයිතම ප්‍රමාණයක් හසුවන සේ බදු පුළුල් කිරීමත් මෙන්ම, ස්ථාවරව පවත්නා ස්වභාවයක් නොමැති වියහැකි ප්‍රාථමික භාණ්ඩ වෙළෙඳපොලෙහි වාසිදායක මිල ගණන්ද හේතුකොටගෙන වර්ෂය තුළදී දක්නට ලැබුණු ඉහළ ආදායම් සංවේදිතාවය තාවකාලික සිද්ධියක් විය හැක. මහ බැංකුවේ ලාභ මාරුකිරීම රහිතව මුළු ආදායම දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 18 සිට සියයට 19 දක්වා වැඩි විය. 1983 වසර සඳහා මුළු ආදායම/දළ දේශීය නිෂ්පාදිත අනුපාතිකය සියයට 21 ක් විය.

බදු ආදායම මුළු ආදායමෙහි කොටසක් සේ 1982 දී සියයට 87 සිට 1983 දී සියයට 82 දක්වා අඩු විය. කෙසේ වුවද, මහ බැංකුවේ ලාභ මාරුකිරීම් රහිතව ගත්කල 1983 දී එම කාණ්ඩ දෙකෙහිම සාපේක්ෂ කොටස් සම්පූර්ණයෙන්ම පාහේ නොවෙනස්ව පැවතුණි. පෙර පරිදිම වක්‍ර බදු, ආදායමෙහි විශාලතම ප්‍රභවය වූ අතර සැසඳීමේදී, එය 1982 දී සියයට 78 ක් වූ අතර, 1983 දී සියයට 81 ක් විය. රජයේ ආදායම ඉහළ නැංවීමේ සහ එම තත්ත්වයේම පවත්වා ගෙන යාමේ කාර්ය සඳහා, වක්‍ර බදු මත වූ දැඩි රැඳියාව මින් පිළිබිඹු කරයි. වක්‍ර බදු ආදායම සියයට 39 කින් වැඩි වූ අතර, එය විශාල වශයෙන් පිරිවැටුම් බදු, ආනයන බදු සහ තේ බදු මගින් ලද ඉහළ ලැබීම් නිසා ඇති වූවකි.

රුපියල් දශ ලක්ෂ 6,224 ක් වූ පිරිවැටුම් බදු ආදායම, 1983 වසරේදී මුළු බදු ආදායමින් සියයට 30 ක් විය. එය ඉකුත් වසරේ එකතුවට වඩා සියයට 54 ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. ඉහළ නැංවූ බදු අනුපාතිකයන් සහ ආනයනය කරන අවස්ථාවේදී ගෙවන ලද පිරිවැටුම් බදු මත ආනයනකරුවන්ට දී තිබුණු ආනයන පිරිවැටුම් බදු සහන ඉවත් කිරීම ද, වඩාත් හොඳින් බදු නීතිය ක්‍රියාත්මක කරවීම ද, මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදන අංශය මත වූ පිරිවැටුම් බදු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,718 ක් වූ අතර, නිෂ්පාදන නොවන අංශයේ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,891 ක් විය. ආනයන මත වූ පිරිවැටුම් බදු එකතුව රුපියල් දශ ලක්ෂ 1,615 ක් විය.

## රජයේ ආදායම සහ වියදම

මුදල් වර්ෂ අනුව




ශ්‍රී ලංකා මහ බැංකුව.

**1983 සංඛ්‍යා තාවකාලිකය.**

ජාත්‍යාන්තර වෙළෙඳාම මත වූ බදු ඉකුත් වසරට වඩා සියයට 50 ක වැඩි වීමක් වාර්තා කරන ලද අතර, එය මුළු වක්‍ර බදුවලින් සියයට 59 ක් විය. සැසඳීමේදී 1982 වසරේ එය සියයට 55 ක් විය. මුළු බදු ආදයමින් ජ ාත්‍යාන්තර වෙළෙඳාම ත වූ බදු ප්‍රමාණය සියයට 48 ක් වූ අතර, සැසඳීමේදී 1982 දී එය සියයට 43 ක් විය. ජාත්‍යන්තර වෙළෙඳාම වැනි බාහිර විචලනයන්ට ලක් විය හැකි අංශය මත වැඩි වශයෙන් බදු ආදමයම රඳා පැවතීම නිසා, රාජ්‍ය මූල්‍ය කටයුතු කෙරේ අයහපත් බලපෑමක් ඇතිවීමේ අවකාශ වැඩි කරනු ලබයි. අනෙක් අතට චක්‍රිය උත්පාතයන් පවතින අවස්ථාවන්හිදී පැනනගින ලාභදායි තත්වයන් නිසා ආදයමේ ඇතිවන වැඩිවීම තාවකාලික ස්වරූපයක් ගන්නා හෙයින්, ආදයමේ වැඩිවීමට සමාන ප්‍රමාණයකින් වියදම් වැඩිවීමක් සඳහා අවකාශ නොදේ.

1982 වසර සමඟ සැසඳීමේදී, සියයට 1 ක අඩු වීමක් වාර්තා කරමින් අපනයන බදුවලින් ලද මුළු ආදයම රුපියල් දශ ලක්ෂ 2,459 ක් විය. මෙහි ප්‍රතිඵලයක් සේ ජාත්‍යන්තර වෙළෙඳාම මත බදුවල කොටසක් වශයෙන් සහ මුළු බදු ආදයමෙහි කොටසක් වශයෙන් අපනයන බදු ආදයම 1982 සහ 1983 වර්ෂ අතරදී පිළිවෙලින් සියයට 38 සිට සියයට 25 දක්වා සහ සියයට 16 සිට සියයට 12 දක්වා අඩු විය. මෑත කාලයේදී දක්නට ලැබුණු උපනතිය තහවුරු කරමින්, මෙම අඩු වීමට ප්‍රධාන හේතුව අපනයන පරිමාව මත අය කරනු ලබන තේවලින් ලද අපනයන බදු අඩු වීමය. 1983 ජූලි මාසයේදී බදු අනුපාතයේ වැඩි කිරීමක් තිබියදී ද, රුපියල් දශ ලක්ෂ 1,290 ක් වූ විශේෂිත තේ අපනයන බදු ලැබීම් ඉකුත් වසර සමඟ සැසඳීමේදී සියයට 11 ක අඩු වීමක් දක්විය. මෙම අඩු වීමට හේතු වූයේ තේ අපනයන පරිමාව සියයට 13 කින් පහත වැටීම ය. රබර් සම්බන්ධයෙන් බලන කල මිලෙහි වන වෙනස්වීම අනුව අයකරනු ලබන බදු ප්‍රමාණයන් අඩුවනසේ ප්‍රතිශෝධනයක් සහ අපනයන පරිමාවේ සියයට 5 ක පහත වැටීමක් තිබියදී ද, වාසිදයක අපනයන මිල ගණන් නිසා මුළු ආදයම 1982 වසරට වඩා සියයට 13 කින් වැඩි විය. 1983 වසරේදී රබර්වලින් ලත් මුළු අපනයන බදු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 852 ක් විය. පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතවලින් ලද අපනයන බදු පසුගිය වසරට වඩා සියයට 26 ක වැඩි වීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 241 ක් විය. අනෙකුත් අපනයනවලින් ලද රුපියල් දශ ලක්ෂ 76 ක ආදයමින් ඉකුත් වසරට වඩා සියයට 20 ක අඩු වීමක් පෙන්නුම් කරන ලදී.

දෙවැනි විශාලතම ආදයම් ශීර්ෂය වූ ආනයන බදු ඉකුත් වසරට වඩා සියයට 50 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 4,836 ක් විය. 1983 වසරේදී ආනයන බදු මුළු බදු ආදයමින් සියයට 23 ක් වූ අතර, සැසඳීමේදී 1982 වසරේ එය සියයට 21 ක් විය. ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු සම්බන්ධයෙන් සළකන විට ආනයන බදුවල කොටස නොවෙනස්ව සියයට 49 ක් සේ පැවතින. ආනයන බදුවල නිරපේක්ෂ වැඩි වීමට හේතු වූයේ, ප්‍රධාන වශයෙන්ම බදු අනුපාතයන් ඉහළ නැංවීම සහ මෙතෙක් බදුවලට යටත් නොවූ සහල්, පිටි, ඛනිජ තෙල් සහ පොහොර ද ඇතුළත් වන සේ බදු අය කරන ආනයන කාණ්ඩයේ ඇතිකළ පුළුල් කිරීමයි.

1983 වසරේදී මුළු වරණ අලෙවි බදු රුපියල් දශ ලක්ෂ 3,230 දක්වා සියයට 42 කින් වැඩි වූ අතර එය දුම්කොළ, තේ සහ මත්පැන්වලින් ලද ඉහළ ආදයම් නිසා ඇති විය. රුපියල් දශ ලක්ෂ 1,431 ක් වූ දුම්කොළ බදු සියයට 9 ක වැඩි වීමක් වාර්තා කළ අතර, එය 1983 වර්ෂයේදී නෙවතාවකදීම දුම්කොළ බදු ඉහළ නැංවීමේ ප්‍රතිශෝධනයන් ඇති කළ නිසා සිදු විය. 1983 මාර්තු මාසයේදී අවම මිල, කිලෝවක් රුපියල් 22.00 සිට රුපියල් 26.00 දක්වා ඉහළ යන සේ ප්‍රතිශෝධනයක් කර තිබුන ද, තේවලින් ලද වරණ අලෙවි බදු ලැබීම් ඉකුත් වසරට වඩා හය ගුණයක වැඩි වීමක් සටහන් කරමින් රුපියල් දශ ලක්ෂ 932 ක් විය. මෙම වැඩි වීම වසරතුළදී පැවති තේ වෙන්දේසි මිල තියුණු ලෙස ඉහළ යාම නිසා ඇති විය. මත්පැන් මත බදු ආදයම රුපියල් දශ ලක්ෂ 867 ක් වූ අතර, එයින් සියයට 7 ක වැඩි වීමක් දක්විනා,

සියයට 15 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් ආදයම් බදුවලින් ලැබූ ආදයම රුපියල් දශ ලක්ෂ 3,367 ක් විය. රුපියල් දශ ලක්ෂ 2,475 ක් වූ සාමූහික බදු සියයට 17 ක වැඩි වීමක් පෙන්නුම් කළ අතර, රුපියල් දශ ලක්ෂ 892 ක් වූ සාමූහික නොවන බදු සියයට 10 කින් වැඩි විය. සාමූහික ආදයම් මත බදුවල වැඩි වීමට හේතු වූයේ නිෂ්පාදන, බැංකු සහ ගමනාගමන අංශයන්ගෙන් ලද ඉහළ බදු එකතුවයි. රාජ්‍ය අංශයේ සාමූහික ආයතනවලින් ලත් බදු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,189 ක් වූ අතර, ආසන්න වශයෙන් එය සාමූහික ආදයම් බදුවලින් සියයට 48 ක් විය. ඉකුත් වසරේ මෙම ප්‍රමාණය සියයට 40 ක් විය.

1983 වසරේ බදු නොවන ආදයම්හි ප්‍රධාන ශීර්ෂය වූයේ මහ බැංකුවේ ලාභවලින් මාරු කරන ලද රුපියල් දශ ලක්ෂ 1,500 ක ප්‍රමාණයයි. මෙම මාරු කිරීම මුදල් නීති පනත* අනුව සිදුකළ අතර, එය මහ බැංකුව වෙත වූ රජයේ ණය වගකීම් පියවා ගැනීම පිණිස උපයෝජනය කිරීම සඳහා විය. බදු නොවන ආදයම්වල දෙවැනි විශාලතම ආදයම් ශීර්ෂය වූයේ වෙළෙඳ ව්‍යවසායයන්ගෙන් වූ දළ ලැබීම් ය. එය ඉකුත් වසරට වඩා සියයට 17 ක වැඩිවීමක් දක්වමින් රුපියල් දශ ලක්ෂ 1,457 ක් විය. මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ තැපැල් සහ විදුලි සංදේශ සේවා මගින් වූ වැඩි ලැබීම් ය. අනෙකුත් ප්‍රධාන බදු නොවන ආදයම් ශීර්ෂයන් වූයේ බදු කුලී, පොළී සහ ලාභාංශවලින් ලද රුපියල් දශ ලක්ෂ 821 ක මුදල සහ රුපියල් දශ ලක්ෂ 350 ක් වූ විකුණුම් සහ ගාස්තු ය. බදු කුලී, පොළී සහ ලාභාංශවලින් ලද ආදයමේ ඉකුත් වසරට වඩා සියයට 96 ක වැඩි වීමක් වාර්තා විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ ආහාර කොමසාරිස්ට දුන් භාණ්ඩාගාර අත්තිකාරම් මත ලැබුණු ඉහළ පොළී ආදයම් සහ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් වූ ඉහළ දයකත්වයත් ය. විවිධ විකුණුම්වලින් ලත් අඩු ආදයම නිසා විකුණුම් සහ ගාස්තු සියයට 24 කින් අඩු විය.

### පුනරාවර්තන වියදම

අත්තිකාරම් ගිණුම් කටයුතු රහිතව 1983 වසරේ මුළු පුනරාවර්තන වියදම 1982 වසරට වඩා සියයට 19 ක වැඩි වීමක් පෙන්නුම් කරමින්, රුපියල් දශ ලක්ෂ 23,958 ක් විය. ඉකුත් වසරේ පුනරාවර්තන වියදම්වල වැඩිවීම සියයට 26 ක් විය. රජයේ මුළු වියදමින් පුනරාවර්තන වියදම් සඳහා අදළ කොටස සියයට 51 ක් වූ අතර, 1982 දී එම ප්‍රමාණය සියයට 53 ක් විය. පුනරාවර්තන වියදම දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව 1983 දී සියයට 20 ක් ලෙස නොවෙනස්ව පැවතින.

---

* මුදල් නීති පනතේ 39 වැනි වගන්තියේ පහත සඳහන් පරිදි දක්වේ.

"39. එක් එක් මුදල් වර්ෂයක අවසානයෙන් පසු දවස් හැටක් ඉකුත් වීමට පෙර, පහත දක්වෙන විධිවිධානයන්ට අනුකූලව මුදල් මණ්ඩලය විසින් ශුද්ධ ලාභ බෙද හැරිය යුතුය.

(අ) පළමුව–ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලුම ශුද්ධ ලාභ, පහත දක්වෙන වගන්තියෙහි අර්ථ නිරූපනය කර ඇති මූල්‍ය ගැලපුම් ගිණුම පවතින කවර විටක වුවද එම ගිණුම පූර්ණ වශයෙන් වසා දමන තෙක් ඒ ගිණුම අඩු කිරීම සඳහා යොද ගත යුතුය.

(ආ) දෙවනුව-මූල්‍ය ගැලපුම් ගිණුම වසා දැමීමෙන් පසුව ඉතිරි වන ශුද්ධ ලාභයක් වෙතොත්, එම ශුද්ධ ලාභය බැංකුවේ මුළු ප්‍රාග්ධන ගිණුම, බැංකුවේ මුළු වත්කම් සහ එහි රත්රන් හා විදේශීය මුදල් වත්කම් අතර ඇති වෙනසින් අඩුම වශයෙන් සියයට පහළොවකට සමාන වන තෙක්, අතිරික්තයක් සේ රඳවා ගත යුතුය.

(ඇ) තෙවනුව–ඉහතින් වූ විධිවිධානයන්ට අනුකූලව ක්‍රියා කිරීමෙන් පසුව ඉතිරි වන යම් ශුද්ධ ලාභයක් වෙතොත්, එම ශුද්ධ ලාභය, මුදල් සහ ක්‍රම සම්පාදන විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව, මහ බැංකුවට රජයෙන් ලැබිය යුතුව තිබෙන බැඳීම් කිසිවක් අඩු කර ගැනීම සඳහා යෙදවීම හෝ ඒකාබද්ධ අරමුදලට ගෙවා බැර කිරීම හෝ කළ යුතුය."

ඉහළ ගිය පුනරාවර්තන වියදමින් වැඩි කොටසක් රාජ්‍ය ණය මත පොළී ගෙවීම්, පෞද්ගලික පඩිනඩි සහ විශ්‍රාම වැටුප් සඳහා වූ අතර, ඒවායේ ඒකාබද්ධ වියදම 1982 වසරට වඩා සියයට 23 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 14,088 ක් විය. සැසඳීමේදී ඉකුත් වසරේ වූ වැඩිවීම සියයට 33 ක් විය. ඒ අනුව මුළු පුනරාවර්තන වියදමින් මෙම වියදම්වල ප්‍රමාණය 1982 සියයට 57 සමඟ සසඳන විට 1983 දී සියයට 59 ක් විය. රාජ්‍ය ණය මත පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 6,624 දක්වා සියයට 30 කින් ඉහළ ගිය අතර, එය පුනරාවර්තන වියදමින් සියයට 28 ක් විය. 1982 දී එය සියයට 25 ක් විය. කෙටිකාලීන භාණ්ඩාගාර ණය ගැනීම් ඇතුළුව, දේශීය ණය සඳහා වූ මුළු පොළී ගෙවීම් සියයට 27 ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, රුපියල් දශ ලක්ෂ 5,345 ක් විය. භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 2,082 ක් වූ අතර, රුපියල් ණය සඳහා පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 3,228 ක් විය. සැසඳීමේදී පසුගිය වසරේ එම ගෙවීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2,001 ක් සහ රුපියල් දශ ලක්ෂ 2,167 ක් විය. 1982 වසරේ දී සහ 1983 වසරේ මුල් භාගයේදී රුපියල් සුරැකුම්පත් නිකුත් කිරීමෙහි සැළකිය යුතු වැඩිවීම සහ 1983 ජූලි මස දක්වා නිකුත් කරන ලද සුරැකුම්පත් මත ගෙවන ලද ඉහළ පොළී අනුපාතයන් ද, රුපියල් ණය සඳහා වූ පොළී ගෙවීම්වල සියයට 49 ක වැඩි වීමට දායක විය. විදේශීය ණය මත පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 1,279 දක්වා සියයට 40 කින් වැඩි විය. මසකට රුපියල් 1,000 ට අඩු ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ට සහ විශ්‍රාම වැටුප් ලබන්නන්ට මසකට රුපියල් 100 ක් බැගින් වැඩි කළ වැටුප් ද, ඒකාබද්ධ වැටුප් පදනම් කොට ගෙවන ලද පාරිතෝෂික දීමනා සහ විශ්‍රාම ලබන්නන්ගේ සංඛ්‍යාව ඉහළ යාම ද නිසා, පෞද්ගලික පඩිනඩි සහ විශ්‍රාම වැටුප් එක්ව ගත් කල එය රුපියල් දශ ලක්ෂ 7,464 දක්වා සියයට 18 කින් වැඩි විය.

සංක්‍රාම ගෙවීම් සහ සහනාධාර මත පුනරාවර්තන වියදම රුපියල් දශ ලක්ෂ 6,410 ක් වූ අතර, ඉකුත් වසරේ දී එය රුපියල් දශ ලක්ෂ 5,662 ක් විය. කෙසේ වුවද, 1983 දී මුළු පුනරාවර්තන වියදමින් සංක්‍රාම ගෙවීම්වලට අදළ කොටස 1982 දී සියයට 28 සිට 1983 දී සියයට 27 දක්වා අඩු විය. ආහාර සහ භූමිතෙල් මුද්දර ක්‍රමයන් මත වියදම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,427 ක් සහ රුපියල් දශ ලක්ෂ 287 ක් වූ අතර, එක්ව ගත් කල එය මුළු සංක්‍රාමයන්ගෙන් සියයට 29 ක් විය. ළදරු කිරි ආහාර සඳහා වූ පාරිභෝගික සහනාධාරය රුපියල් දශ ලක්ෂ 65 ක් වූ අතර, ජාතික කිරි මණ්ඩලය වෙත වූ නිෂ්පාදිත සහනාධාරය රුපියල් දශ ලක්ෂ 21 ක් විය. අමු තේ දළු සඳහා මිල ආධාරක ක්‍රමය යටතේ වූ වියදම ඉකුත් වසරේ රුපියල් දශ ලක්ෂ 24 සමඟ සසඳන විට වාසිදායක නිෂ්පාදන මිල ගණන් හේතුකොට ගෙන රුපියල් දශ ලක්ෂ 1 කට සීමා විය. ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි (ජා. ඉ. බැං.) පොළී සහනාධාරය රුපියල් දශ ලක්ෂ 500 ක් වූ අතර, 1982 දී එය රුපියල් දශ ලක්ෂ 401 ක් විය. මෙම පොළී ගෙවීම්වලින් රුපියල් දශ ලක්ෂ 330 ක් 1983 වසර සඳහා වූ අතර, ශේෂය 1982 මුදල් වර්ෂය සඳහා විය. සහනාධාර අනුපාතයන් අඩු කිරීම හේතුකොට ගෙන පොහොර සහනාධාරය ඉකුත් වසරට වඩා සියයට 25 ක අඩු වීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 694 ක් විය. ආනයන බදු ප්‍රතිදාන ක්‍රමය යටතේ වියදම 1982 දී රුපියල් දශ ලක්ෂ 713 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 780 දක්වා වැඩි විය.

අලාභ ප්‍රතිපූරණය කිරීම සඳහා රාජ්‍ය සංස්ථාවන්ට සංක්‍රාම කරන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 100 ක් වූ අතර, 1982 දී එය රුපියල් දශ ලක්ෂ 24 ක් විය. ප්‍රධාන අර්ථලාභීන් වූයේ ජාතික පේෂකර්ම සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 34), රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 24), ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 20) සහ ජාතික ඇඹුරුම් ද්‍රව්‍ය සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 8)ය. ලංකා විදුලි බල මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 441), ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 183), ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 140), ලංකා සංචාරක මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 75), රජයට පවරාගත් ව්‍යාපාර (රුපියල් දශ ලක්ෂ 59) සහ වී අලෙවි මණ්ඩලය (රුපියල්

දශ ලක්ෂ 48) සඳහා කළ සංක්‍රාමයන් වර්තන සංක්‍රාමයන්හි ඇතුළත් වේ. ජාතික ආධුනිකත්ව මණ්ඩලය සහ ජාතික තරුණ සේවා සභාව සඳහා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 50 ක් සහ රුපියල් දශ ලක්ෂ 32 ක් ප්‍රදානය කරන ලදී. විශ්ව විද්‍යාලවලට සහ පළාත් පාලන ආයතනවලට කරන ලද සංක්‍රාම ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 193 ක් සහ රුපියල් දශ ලක්ෂ 349 ක් විය.

පරිපූරක ඇස්තමේන්තුද ඇතුළත්ව ඇස්තමේන්තුගත මුළු වියදම සමග සැසඳීමේදී නියම පුනරාවර්තන වියදම, රුපියල් දශ ලක්ෂ 2,312 ක හෙවත් සියයට 9 ක ඌන උපයෝජනයක් දක්විය. සැළකිය යුතු ඌන උපයෝජනයන් වාර්තා කළ ශීර්ෂයන් වූයේ පොළී ගෙවීම් (රුපියල් දශ ලක්ෂ 745), පොහොර සහනාධාරය (රුපියල් දශ ලක්ෂ 306), ජාතික ඉතිරි කිරීමේ බැංකු පොළී සහනාධාරය (රුපියල් දශ ලක්ෂ 170), ආහාර මුද්දර ක්‍රමය (රුපියල් දශ ලක්ෂ 83) සහ අමු තේ දළු සඳහා මිල ආධාරක ක්‍රමය (රුපියල් දශ ලක්ෂ 23) ය.

අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා වසර තුළදී දරන ලද රුපියල් දශ ලක්ෂ 195 ක වියදම, මුළු පුනරාවර්තන වියදමින් සියයට 1 ක පමණ සුළු ප්‍රමාණයක් විය. එහෙත් පසුගිය වර්ෂවලදී ප්‍රාග්ධන වියදම් සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීම නිසා ඇතිවූ ව්‍යාපෘතීන් රසක් පවත්වාගෙන යාම සඳහා ඉදිරි වර්ෂවලදී අළුත්වැඩියා කිරීමේ සහ නඩත්තු කිරීමේ වියදම් තව දුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින් බදු සහ බදු නොවන රජයේ ආදායම්, සාමාන්‍යයෙන් වැඩි වන පුනරාවර්තන වියදම් පියවා ගැනීමට පමණක් නොව, අතිරේක වර්තන වියදම් ද පියවා ගනිමින් වර්තන ගිණුමේ හිඟයක් ඇතිවීම වැළැක්වීමට සමත් විය යුතුය. බදු පරිපාලනය තවදුරටත් කාර්යක්ෂම කිරීම සහ ක්‍රමානුකූල කිරීම මගින් රාජ්‍ය අංශයට මාරු කරනු ලබන සම්පත් ප්‍රමාණය වැඩි කළ හැකි අතර, රාජ්‍ය සංස්ථාවන් ඔවුන්ගේ ලාභාංශ, ලාභ මාරු කිරීම් සහ ගාස්තු මගින් රජයේ විශාල ආයෝජන මාර්ගයට දායක කර ගත යුතුය.

**අත්තිකාරම් ගිණුම්**

අත්තිකාරම් ගිණුම් කටයුතුවලින් 1982 දී ඇතිවූ රුපියල් දශ ලක්ෂ 879 ක ශුද්ධ ලැබීමට ප්‍රතිවිරුද්ධව, 1983 දී රුපියල් දශ ලක්ෂ 1,120 ක ශුද්ධ ගෙවීමක් විය. 1983 මුල් අයවැය ඇස්තමේන්තුවලද රුපියල් දශ ලක්ෂ 525 ක ශුද්ධ ගෙවීමක් අපේක්ෂා කරන ලද නිසා අත්තිකාරම් ගිණුම් කටයුතුවල ඇතිවූ මෙම වෙනස මුළුමනින්ම බලාපොරොත්තු සහගත නොවූ තත්ත්වයක් නොවින. ඒ කෙසේ වුවද අත්තිකාරම් ගිණුම් කටයුතු නැවත වරක්, අයවැය කටයුතු සඳහා පවත්නා සම්පත් ප්‍රයෝජනයට ගන්නා එක් අංගයක් බවට පත්වූ බව සටහන් කළ යුතුය. එම සම්පත් ප්‍රමාණය 1983 වර්ෂයේ ආදයම් ලැබීම්වලින් සියයට 4 ක් පමණ විය. රජයේ දෙපාර්තමේන්තුවල අත්තිකාරම් ගිණුම් කටයුතු මගින් රුපියල් දශ ලක්ෂ 416 ක ශුද්ධ ගෙවීමක් ඇතිවිය. ප්‍රධාන ගෙවීම් ඇතිවූයේ ආහාර කොමසාරිස් (රුපියල් දශ ලක්ෂ 105), දුම්රිය (රුපියල් දශ ලක්ෂ 69), ප්‍රධාන රේගු අයකැමි (රුපියල් දශ ලක්ෂ 52), අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව (රුපියල් දශ ලක්ෂ 14) සහ විනිමය වෙනස්කම් ගිණුම (රුපියල් දශ ලක්ෂ 43) සම්බන්ධයෙනි. විනිමය වෙනස්කම් ගිණුමෙහි දක්වූ ශුද්ධ ගෙවීම ශ්‍රී ලංකා/චීන වෙළෙඳ ගිණුම පියවීමේදී යොදගත් පොත් ගැලපිලි නිසා ඇතිවූවක් වන අතර, එම ශුද්ධ ගෙවීම මගින් දක්වූයේ විනිමය අනුපාතයෙහි වෙනස්කම් නිසා, අදාළ නියෝජ්‍යායතන සහ දෙපාර්තමේන්තුවලින් අයකර ගන්නා තෙක් අවිනිශ්චිතව තිබුණු පාඩු ප්‍රමාණයකි. ජාතික පේෂකර්ම සංස්ථාවට අත්තිකාරම් ගිණුම් සහ අතිරික්ත ශේෂයන්ගෙන් දෙන ලද ණය යටතේ වර්ගීකරණය කර ඇති, රුපියල් දශ ලක්ෂ 420 ක අත්තිකාරම වසර තුළ අත්තිකාරම් ගිණුම් කටයුතුවල අවසාන සමස්ත තත්ත්වය කෙරේ විශාල වශයෙන් බලපා ඇත. මෙයින් රුපියල් දශ ලක්ෂ 415 ක් මහජන බැංකුවට සංස්ථාව විසින් ණය වී තිබූ මුදලක් පියවා දැමීම සඳහා විය. කෙසේ වුවද, මෙම මුදල බැංකුව විසින් රුපියල් සුරැකුම්පත් මිලදී ගැනීම මගින් රජය වෙත නැවත ලබා දුනි. අත්තිකාරම්වල මෙම පුළුල් කාණ්ඩය යටතේ අනෙකුත් ප්‍රධාන ශුද්ධ

ගෙවීම් වූයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 50), රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 35), ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 25) සහ රජයේ නිලධාරීන්ගේ 'ආ' ගිණුම (රුපියල් දශ ලක්ෂ 62) සම්බන්ධයෙනි. මේ කාණ්ඩය යටතේ ප්‍රධාන ශුද්ධ ලැබීම් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 72), වී අලෙවි මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 61) සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 25) වෙතින් විය. මෙසේ 1983 වසරේ අත්තිකාරම් ගිණුම් සහ අතිරික්ත ශේෂයන්ගෙන් දෙන ලද ණය යටතේ මුළු ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 468 ක් විය. ගබඩා අත්තිකාරම් ගිණුම්වල ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 193 ක් වූ අතර, එය ප්‍රධාන වශයෙන් විදුලි පණිවුඩ ගබඩා සම්බන්ධයෙන් වූ රුපියල් දශ ලක්ෂ 212 ක ආපසු ගෙවීම සහ සාමාන්‍ය ගබඩා ගිණුමෙන් වූ රුපියල් දශ ලක්ෂ 11 ක ලැබීම සහ සිවිල් වෛද්‍ය ගබඩා ගිණුමෙන් වූ රුපියල් දශ ලක්ෂ 10 ක ලැබීම් නිසා ඇති විය. 1983 වසරේදී අනෙකුත් විවිධ අත්තිකාරම් ගිණුම්වලින් රුපියල් දශ ලක්ෂ 42 ක ගෙවීමක් විය.

### ප්‍රාග්ධන වියදම

නිදන් අරමුදලට දායකවීම් සහ ණය ආපසු ගෙවීම් ඇතුළත්ව, ප්‍රාග්ධන වියදම ඉකුත් වසරට වඩා සියයට 16 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1983 දී රුපියල් දශ ලක්ෂ 21,694 ක් විය. එයට ප්‍රතිවිරුද්ධව 1982 දී එහි වැඩිවීම සියයට 40 ක් විය. රජයේ සමස්ත වියදමෙන් ප්‍රාග්ධන වියදමට අදාළ කොටස 1982 දී සියයට 49 සිට 1983 දී සියයට 46 දක්වා අඩු විය. මුළු ප්‍රාග්ධන වියදම ද. දේ. නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සළකන විටද ඉකුත් වසරෙහි සියයට 19 සිට 1983 දී සියයට 18 දක්වා පහත වැටුණි. නිදන් අරමුදල් දායකවීම් සහ ණය ආපසු ගෙවීම් රහිතව ප්‍රාග්ධන වියදම 1982 වසරේ රුපියල් දශ ලක්ෂ 16,057 සමඟ සසඳන කල රුපියල් දශ ලක්ෂ 16,669 ක් විය. නිදන් අරමුදල් දායකවීම් සහ ණය ආපසු ගෙවීම් රහිතව ප්‍රාග්ධන වියදම, දළ ජාතික නිෂ්පාදිතයේ ගම්‍ය මිල අනුපාතිකය භාවිතා කරමින් (1970 මිල අනුව) ගැලපුම් කිරීමෙන් පසුව ඉකුත් වසරෙහි රුපියල් දශ ලක්ෂ 3,804 සමඟ සසඳන විට සියයට 11 ක අඩු වීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 3,402 ක් විය. කෙසේ වුවද, 1982 දී භාණ්ඩාගාර තැන්පතුවලට මාරු කරන ලද වියදම් වෙන්කිරීම් රුපියල් දශ ලක්ෂ 1,836 ක් සහ 1983 දී මාරු කළ රුපියල් දශ ලක්ෂ 1,454 ක් ද 1983 ප්‍රාග්ධන වියදම්වල ඇතුළත් වේ. මෙම මාරු කිරීම් වෙනුවෙන් ගැලපුම් කිරීමෙන් පසුව, නිදන් අරමුදල් දායකවීම් සහ ණය ආපසු ගෙවීම් රහිත ප්‍රාග්ධන වියදම නාමික වශයෙන් සියයට 7 ක වැඩිවීමක් වාර්තා කළ අතර, මූර්ත වශයෙන් සියයට 8 ක අඩුවීමක් පෙන්විය. අමාත්‍යාංශ අනුව ප්‍රාග්ධන වියදම් පිළිබඳ වර්ගීකරණයක් සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයේ 31 වැනි සංඛ්‍යා සටහනෙහි ඉදිරිපත්කර ඇත.

පරිපූරක ඇස්තමේන්තු ද ඇතුළත්ව, ඇස්තමේන්තු කරන ලද මුළු ප්‍රාග්ධන වියදම සමග සැළකීමේදී නිදන් අරමුදලට දායකවීම් සහ ණය ආපසු ගෙවීම් රහිත නියම ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 3,981 ක හෙවත් සියයට 19 ක ඌන වියදමක් පෙන්නුම් කෙරිනි. කෙසේ වුවද, භාණ්ඩාගාර තැන්පතුවලට මාරු කිරීම් වෙනුවෙන් ප්‍රාග්ධන වියදම ගැලපුම් කිරීමෙන් පසුව සියයට 26 ක ඌන වියදමක් දක්වමින් ඌන වියදම රුපියල් දශ ලක්ෂ 5,435 ක් විය.

ඉකුත් වසරේදී තැන්පතුවලට කළ මාරු කිරීම් ද ඇතුළත්ව මහවැලි සංවර්ධන අධිකාරියෙහි තාවකාලික දත්තයන්ට අනුව 1983 දී මහවැලි ව්‍යාපාරය සඳහා නියම වියදම රුපියල් දශ ලක්ෂ 7,131 කට ආසන්න විය. කොත්මලේ (රුපියල් දශ ලක්ෂ 2,054), වික්ටෝරියා (රුපියල් දශ ලක්ෂ 1,839), රන්දෙනිගල (රුපියල් දශ ලක්ෂ 891) සහ මාදුරු ඔය (රුපියල් දශ ලක්ෂ 345) යන කඩිනම් මහවැලි වැඩ පිළිවෙලට අයත් ප්‍රධාන ව්‍යාපෘති හතර සඳහා මුළු ප්‍රාග්ධන වැයෙන් රුපියල් දශ ලක්ෂ 5,129 ක් වර්ෂය තුළදී වියදම් කරන ලදී. ''බී'' සහ ''සී'' වාරිමාර්ග පද්ධති සඳහා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 753 ක් සහ රුපියල් දශ ලක්ෂ 523 ක උපයෝජනයක් ද සහිතව පහළ නිම්න සංවර්ධන කටයුතු සඳහා වූ වියදම රුපියල්

දශ ලක්ෂ 1,276 ක් විය. තවද, රුපියල් දශ ලක්ෂ 298 ක මුදලක් මිනිපේ අන්තර් නිම්න ඇල සංකීර්ණය සඳහා වැය කළ අතර, I වැනි සහ II වැනි අදියරයන් සඳහා වියදම රුපියල් දශ ලක්ෂ 293 ක් විය. එයට අමතරව රුපියල් දශ ලක්ෂ 134 ක මුදලක් මහවැලි සංවර්ධන වැඩපිළිවෙල හා සම්බන්ධ අනෙකුත් කටයුතු සඳහා වියදම් කරන ලදී.

පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අනුව එම අමාත්‍යාංශයෙහි මුළු ප්‍රාග්ධන සම්මතයෙන් සියයට 23 ක ප්‍රමාණයක් ඇදගනිමින් රුපියල් දශ ලක්ෂ 547 ක මුදලක් නිවාස වැඩපිළිවෙල සඳහා වැයවී ඇත. නාගරික නිවාස වැඩපිළිවෙල සඳහා වියදම රුපියල් දශ ලක්ෂ 392 ක් විය. අත්තම් නිවාස වැඩපිළිවෙල (ආදර්ශ ගම්මාන සහ යටිතල පහසුකම් ඇතුළුව), මැතිවරණ කොට්ඨාශ පදනමින් වූ නිවාස වැඩපිළිවෙල සහ ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා වූ මූල්‍ය වියදම රුපියල් දශ ලක්ෂ 132 ක් විය. රජයේ සේවකයින්ගේ නිල නිවාස ඉදිකිරීම් සඳහා වියදම රුපියල් දශ ලක්ෂ 8 ක් විය. එයට අමතරව රුපියල් දශ ලක්ෂ 15 ක මුදලක් මුඩුක්කු සහ පැල්පත් නගා සිටුවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සහ පොදු පහසුකම් මණ්ඩලය විසින් වැය කර ඇත.

1982 දී රුපියල් දශ ලක්ෂ 93 ක වියදම සමඟ සසඳන විට 1983 දී මහ කොළඹ ආර්ථික කොමිසමේ කටයුතු වෙනුවෙන් දරන ලද වියදම රුපියල් දශ ලක්ෂ 347 ක් විය. මෙයින් මහ කොළඹ ප්‍රදේශය තුළ ජල සම්පාදන සහ ජලාපවහන යෝජනා ක්‍රමයේ දෙවන අදියර සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් රුපියල් දශ ලක්ෂ 281 ක මුදලක් වැය කර ඇත. ආයෝජන ප්‍රවර්ධන කලාපයන් සඳහා වූ ප්‍රාග්ධන දායකත්වය වශයෙන් රුපියල් දශ ලක්ෂ 60 ක මුදලක් මහ කොළඹ ආර්ථික කොමිසම වෙත මුදා හැර ඇත. කටුනායක නිදහස් වෙළෙඳ කලාපයට විදුලි බලය සැපයීම සඳහා රුපියල් දශ ලක්ෂ 6 ක මුදලක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වියදම් කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 705 ක මුදලක් ප්‍රධාන අදාළ අමාත්‍යාංශයන් විසින් වැය කර ඇත. මෙයින් ශ්‍රී ජයවර්ධනපුර රෝහල සඳහා වියදම රුපියල් දශ ලක්ෂ 650 ක් විය. පාර්ලිමේන්තු සහ පරිපාලන සංකීර්ණයන්ට සම්බන්ධ ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 16 ක මුදලක් ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව වැය කළ අතර, රුපියල් දශ ලක්ෂ 38 ක මුදලක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වැය කර ඇත. තවද, රුපියල් දශ ලක්ෂ 1 ක මුදලක් ශ්‍රී ජයවර්ධනපුර ප්‍රදේශයෙහි ජල සම්පාදන කටයුතු සඳහා ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය විසින් වැයකර ඇත.

ඉකුත් වසරේදී මෙන්ම 1983 වර්ෂයේදී ද විමධ්‍යගත අයවැය යටතේ වෙන්කළ මුදල රුපියල් දශ ලක්ෂ 420 ක් විය. වසර තුළදී මුළු වියදම රුපියල් දශ ලක්ෂ 417 ක් විය. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල සඳහා අයවැය ප්‍රතිපාදනය රුපියල් දශ ලක්ෂ 459 ක් වූ අතර, වියදම රුපියල් දශ ලක්ෂ 266 ක් විය.

ආයෝජන සඳහා ණය වශයෙන් දෙන ලද රුපියල් දශ ලක්ෂ 801 ක මුදල් ද මුළු ප්‍රාග්ධන වියදමෙහි ඇතුළත් වේ. ඉකුත් වසර හා සසඳන විට එය සියයට 11 ක වැඩිවීමක් පෙන්වීය. ණය වශයෙන් කරන ලද මුළු වියදමින් රුපියල් දශ ලක්ෂ 434 ක් ලංකා විදුලි බල මණ්ඩලයට ලැබුණි. අනෙකුත් ප්‍රතිග්‍රාහකයින් වූයේ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 262), ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 45), සී. ස. ගලදාරි හෝටල් ලංකා සමාගම (රුපියල් දශ ලක්ෂ 50) සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල (රුපියල් දශ ලක්ෂ 10) ය.

**අයවැය හිඟය පියවීම**

1983 වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතුවලින් ඇතිවූ අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 21,562 ක් විය. පසුගිය වසර හා සාපේක්ෂව සළකන කල මෙය සියයට 7 ක ඉහළ නැගීමකි. කෙසේ වුව ද, රජයේ සමස්ත වියදමට සාපේක්ෂව සැළකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරමින් අයවැය හිඟය සියයට 53 සිට සියයට 46 දක්වා පහත වැටින. වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1982 දී සියයට 20 ක් වූ අයවැය හිඟය 1983 දී සියයට 18 දක්වා පහත වැටුණි. වර්තන ගිණුමේ ඇතිවූ රුපියල් දශ ලක්ෂ 132 ක අතිරික්තය නිසා පසුගිය තුන් වසරට ප්‍රතිවිරුද්ධව 1983 වසරේ අයවැය හිඟය ප්‍රාග්ධන ගිණුමට පමණක් සීමා විය.

අයවැය හිඟය පියවීමේදී හිඟයෙන් සියයට 51 ක් විදේශීය සම්පත් මගින් මූල්‍යකරණය කරන ලද අතර, 1982 දී මෙම ප්‍රමාණය සියයට 44 ක් විය. වර්ෂය තුළදී ලබා ගත හැකිවූ විදේශීය මූල්‍ය සම්පත් ප්‍රමාණය සියයට 24 ක වැඩිවීමක් දක්වමින් රුපියල් දශ ලක්ෂ 10,902 ක් විය. පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද අයවැය කටයුතු සඳහා යොදා ගත් විදේශීය මූල්‍ය ප්‍රමාණය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 9 කට ආසන්න විය. මුළු විදේශීය මූල්‍ය ප්‍රමාණය, ව්‍යාපෘති ණය, භාණ්ඩ ණය සහ වෙනත් ණය වශයෙන් රුපියල් දශ ලක්ෂ 7,477 ක් වූ අතර, දීමනා වශයෙන් රුපියල් දශ ලක්ෂ 3,425 ක් විය. මුළු විදේශීය මූල්‍ය ප්‍රමාණයෙන් දීමනා සඳහා අදාළ කොටස සියයට 38 සිට 1983 දී සියයට 31 දක්වා පහත වැටුණි. විදේශීය මූල්‍ය ප්‍රමාණයෙන් යෝජනා ක්‍රම ණය සහ භාණ්ඩ ණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5,150 ක් සහ රුපියල් දශ ලක්ෂ 1,467 ක් විය. ශේෂය අනෙකුත් ණය මගින් ලබා ගන්නා ලද අතර, එය සමන්විත වූයේ යූරෝ මුදල් වෙළෙඳ ණයෙහි කොටසක් වශයෙන් ලබා ගත් රුපියල් දශ ලක්ෂ 607 ක් සහ 1982 දී ලබාගත් ජපන් යෙන් බැඳුම්කර නිකුත් කිරීම මගින් ලබා ගෙන උපයෝජනය කළ රුපියල් දශ ලක්ෂ 253 කිනි.

පසුගිය වසර හා සැසඳීමේදී දේශීය අංශයන්ගෙන් ලබාගත හැකි වූ රුපියල් දශ ලක්ෂ 11,354 ක මුළු සම්පත් ප්‍රමාණය මගින් රුපියල් දශ ලක්ෂ 259 ක් නැතහොත් සියයට 2 ක අඩුවීමක් පෙන්නුම් කරනු ලැබිනි. බැංකු නොවන අංශයන්ගෙන් ලබාගත් දේශීය වෙළෙඳ පොළ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,762 ක් වූ අතර, එයින් පසුගිය වසරට වඩා සියයට 32 ක වැඩිවීමක් වාර්තා කරන ලදී. මුළු අයවැයෙහි කොටසක් වශයෙන් එය සියයට 36 ක් වූ අතර, දේශීය මූල්‍යකරණයේ කොටසක් වශයෙන් සියයට 68 ක් විය. දළ ජාතික නිෂ්පාදිතයට සාපේක්ෂව, දේශීය මූලයන්ගෙන් ලබා ගත හැකිවූ මුළු සම්පත් ප්‍රමාණය සියයට 6.3 ක් වූ අතර, එය 1982 වසරේ සියයට 5.9 ක් විය. බැංකු නොවන අංශවල මෙම දියුණුවට හේතු වූයේ රුපියල් සුරකුම්පත් සඳහා නිදන් අරමුදල් (රුපියල් දශ ලක්ෂ 3,037), සේවක අර්ථසාධක අරමුදල් (රුපියල් දශ ලක්ෂ 2,355) සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව (රුපියල් දශ ලක්ෂ 2,300) මගින් වූ දායක මුදල් වැඩිවීම නිසාය.

වෙළෙඳ පොළ නොවූ මූලයන්ගෙන් ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,389 ක් වූ අතර, 1982 දී එය රුපියල් දශ ලක්ෂ 1,713 ක් විය. අයවැය හිඟයේ සමස්ත මූල්‍යකරණ ප්‍රමාණයෙන් එයට අදාළ කොටස සියයට 11 ක් වූ අතර, එය 1982 දී සියයට 9 ක් විය. මෙම ණය ගැනීම් විවිධ තැන්පතුවලින් සමන්විත වූ අතර, එම තැන්පතුවලට වියදම් ප්‍රතිපාදනයන් මාරු කිරීමෙන් පැන නගින තැන්පතු ද ඇතුළත් විය. මුළු වෙළෙඳ පොළ නොවන ණය ගැනීම් වලින් පරිපාලන ණය රුපියල් දශ ලක්ෂ 219 ක් විය.

බැංකු මූලයන්ගෙන් ගත් දේශීය වෙළෙඳ පොළ ණය රුපියල් දශ ලක්ෂ 1,203 ක් වූ අතර, එය 1982 දී රුපියල් දශ ලක්ෂ 4,006 ක් විය. එමගින් අයවැය හිඟය පියවීම සඳහා උද්ධමනකාරී මූලයන් අයවැය කෙරෙහි යොමුවීම අවම කරගනු ලැබිනි. ඒ අනුව අයවැය හිඟය පියවීමේදී බැංකුවලට අදාළ මූල්‍යකරණ ප්‍රමාණය 1982 දී සියයට 20 සිට 1983 දී සියයට 6 දක්වා පහත වැටින. ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් වශයෙන් එය 1982 දි සියයට 4 සිට

1983 දී සියයට 1 දක්වා අඩුවීමක් වාර්තා කරන ලදී. බැංකු අංශයේ දායකත්වය මහ බැංකු අත්තිකාරම් (රුපියල් දශ ලක්ෂ 654), රුපියල් ණය (රුපියල් දශලක්ෂ 415) සහ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම්වලින් (රුපියල් දශ ලක්ෂ 134) සමන්විත විය. හිඟය පියවීම සඳහා මහ බැංකුවේ මූල්‍යකරණ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,340 ක් වූ අතර, එය සමන්විතවූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දායක මුදල් ගෙවීමට දෙන ලද රුපියල් දශ ලක්ෂ 277 ක විශේෂ අත්තිකාරම්ද ඇතුළත්ව රුපියල් දශ ලක්ෂ 654 ක් වූ මහ බැංකු අත්තිකාරම් වලින් සහ වාණිජ බැංකු විසින් දරන ලද භාණ්ඩාගාර බිල්පත් මහ බැංකුවට මාරුවීම නිසා භාණ්ඩාගාර බිල්පත් මගින් මූල්‍යකරණය කරන ලද රුපියල් දශ ලක්ෂ 686 කිනි. හිඟය මූල්‍යකරණය කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 415 ක් රුපියල් සුරකුම් පත් මගින් වාණිජ බැංකු විසින් දායක වූ අතර, භාණ්ඩාගාර බිල්පත් මගින් මූල්‍ය කරණය කිරීම රුපියල් දශ ලක්ෂ 552 කින් අඩු විය. මේ නිසා වාණිජ බැංකු වෙත ශුද්ධ වශයෙන් රුපියල් දශ ලක්ෂ 137 ක ආපසු ගෙවීමක් විය. සියලුම මූලයන්ගෙන් ලබාගත් මුදල් අයවැය හිඟයට වඩා රුපියල් දශ ලක්ෂ 694 කින් වැඩිවූ නිසා ප්‍රතිපාර්ශ්වීය අරමුදල රුපියල් දශ ලක්ෂ 268 කින් සහ මුදල් ශේෂය රුපියල් දශ ලක්ෂ 426 කින් වැඩි විය.


**රාජ්‍ය ණය**

1983 වසර අවසානයේදී නො පියවන ලද දළ රාජ්‍ය ණය පසුගිය වසරට වඩා සියයට 23 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 98,380 ක් විය. දේශීය ණය රුපියල් දශ ලක්ෂ 52,355 කින් සහ විදේශීය ණය රුපියල් දශ ලක්ෂ 46,025 කින් දළ රාජ්‍ය ණය සමන්විත විය. පසුගිය වසර සමඟ සැසඳීමේදී, දේශීය ණයවල වැඩිවීම සියයට 15 ක් විය. වෙනත් ජාත්‍යන්තර මුදල් වර්ගයන්ට අනුව ශ්‍රී ලංකා රුපියලෙහි අගය හීනවීම නිසා ඇතිවූ රුපියල් දශ ලක්ෂ 5,254 ක අතිරේක වගකීමක් සහිතව විදේශීය ණයවල වැඩිවීම සියයට 33 ක් විය. විනිමය අනුපාතික වෙනස්වීම් නිසා ඇතිවූ අතිරේක වගකීම රහිතව නොපියවූ විදේශීය ණය වෙතින් සියයට 19 ක වැඩිවීමක් වාර්තා විය. ණයවල ඉහළ වර්ධන අනුපාතය පිළිබිඹු කරමින් විදේශීය ණය, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස 1982 දී සියයට 35ක සිට 1983 දී සියයට 38 දක්වා ඉහළ නැගුණි. 1983 වසර අවසානයේදී ශුද්ධ රාජ්‍ය ණය (නිදන් අරමුදල් අඩු කළ පසු රාජ්‍ය ණය) සියයට 21 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 86,423 ක් විය.

පසුගිය වසරට වඩා සියයට 30 ක වැඩිවීමක් සටහන් කරමින් 1983 දී රාජ්‍ය ණය මත මුළු පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 6,593 ක් විය. 1982 දී එහි වැඩිවීම සියයට 37 ක් විය. රාජ්‍ය ණය ඉකුත් වසරට වඩා සියයට 23 කින් වැඩි වුවද, වර්ෂය තුළ පොළී වගකීම්වල අඩු වර්ධන වේගයට හේතු වූයේ වාසිදායක පොළී අනුපාතයන් මත ගිවිස ගන්නා ලද විදේශීය ණයවල සැළකිය යුතු වැඩිවීමයි. 1983 දී දේශීය ණය සඳහා සාමාන්‍ය වාර්ෂික පොළී අනුපාතය සියයට 11.6 ක් වූ අතර, විදේශීය ණය සඳහා සියයට 3.6 ක් විය. කෙසේ වුවද, දළ දේශීය නිෂ්පාදිත-යෙහි ප්‍රතිශතයක් වශයෙන් මුළු පොළී ගෙවීම් මෑතදී දක්නට ලැබුණු ඉහළ යාමේ උපනතියම අනුව යමින් සියයට 5.1 සිට 1983 දී සියයට 5.4 දක්වා වැඩි විය. මුළු ණය සේවාකරණ ගෙවීම් (පොළී වගකීම්, ණය ආපසු ගෙවීම් සහ නිදන් අරමුදලට දායකවීම්) 1983 දී රුපියල් දශ ලක්ෂ 11,618 ක් වූ අතර, එමගින් පසුගිය වසරට වඩා සියයට 51 ක වැඩිවීමක් වාර්තා විය.

1983 වසර අවසානයේ දී මුළු දේශීය ණය, දිගු හා මැදි කාලීන ණය රුපියල් දශ ලක්ෂ 32,150 කින් හා කෙටි කාලීන ණය රුපියල් දශ ලක්ෂ 20,204 කින් සමන්විත විය. වසර-තුළදී දිගු හා මැදි කාලීන ණයවල වැඩිවීම පසුගිය වසරට වඩා සියයට 23 ක් වූ අතර, කෙටි-කාලීන ණයවල වැඩිවීම සියයට 4 ක් විය. මෙම වෙනස් වූ වර්ධන වේගයන් පිළිබිඹු කරමින් මුළු දේශීය ණයෙහි දිගු හා මැදි කාලීන ණයවල ප්‍රමාණය සියයට 57 සිට 1983 දී සියයට 61 දක්වා වැඩි විය. 1983 අවසානයේ නොපියවූ දේශීය ණය පිළිබඳ විස්තරාත්මක සංයුතිය පසුගිය වසරේ සංසන්දනාත්මක දත්තයන්ද සමඟ 1.48 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## රාජ්‍ය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව

* දළ රාජ්‍ය ණයවලින් නිදන් අරමුදල් අඩුකල පසු

1983 සංඛ්‍යා තාවකාලිකය.

## 1.48 සංඛ්‍යා සටහන
## නොපියවූ දේශීය ණය

රුපියල් දශ ලක්ෂ

| කාණ්ඩය | 1982 | 1983 | වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| අ. මැදි හා දිගු කාලීන ණය .. .. | 26,104·4 | 32,150·2 | 23·2 |
| එයින්: | | | |
| රුපියල් ණය .. .. | 25,800·4 | 31,953·6 | 23·8 |
| පරිපාලන ණය .. .. | 303·9 | 196·5 | – 35·3 |
| ආ. කෙටි කාලීන ණය .. .. | 19,471·0 | 20,204·4 | 3·8 |
| භාණ්ඩාගාර බිල්පත් .. .. | 17,320·0 | 17,400·0 | 0·5 |
| බදු සංචිත සහතික පත් .. .. | 10·7 | 9·9 | – 7·5 |
| මහ බැංකු අත්තිකාරම් .. .. | 2,140·3 | 2,794·5 | 30·6 |
| එකතුව .. .. | 45,575·4 | 52,354·6 | 14·9 |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මැදි හා දිගු කාලීන මුළු දේශීය ණයවලින් ආසන්න වශයෙන් සියයට 99 කින් සමන්විත වූ රුපියල් ණය 1983 දී සියයට 24 කින් වැඩි විය. 1983 දී සුරැකුම්පත් මගින් ලබා ගත් මුළු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 8,188 ක් වූ අතර, එය මුල් අයවැය ඇස්තමේන්තුවල වූ රුපියල් දශ ලක්ෂ 8,000 ඉක්මවීය. 1982 දී මුළු රුපියල් සුරැකුම්පත් නිකුත් කිරීම් රුපියල් දශ ලක්ෂ 6,000 ක් විය. 1983 දී රුපියල් ණය සඳහා දායකවීම් ඉහළ යාමට හේතු වූයේ සේවක අර්ථසාධක අරමුදලෙහි සහ නිදන් අරමුදලෙහි දායකත්වයන්ගේ වැඩිවීමය. පසුගිය වසරවලදී මෙන්ම 1983 දී ද රුපියල් ණය සඳහා ප්‍රධාන දායකයන් වූයේ නිදන් අරමුදල, සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවයි.

පසුගිය වසරට වඩා සියයට 47 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1983 දී රුපියල් ණය සඳහා නිදන් අරමුදලෙහි දායක වීම රුපියල් දශ ලක්ෂ 3,036 ක් විය. නිදන් අරමුදලෙහි සම්පත්වලින් රුපියල් දශ ලක්ෂ 300 ක් නාගරික සංවර්ධන අධිකාරියේ ණයකරවල ද, රුපියල් දශ ලක්ෂ 50 ක් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ණයකරවල ද ආයෝජනය කරන ලදී. 1983 දී නිදන් අරමුදලෙහි ඉහළ මට්ටමක ආයෝජනයට හේතු වූයේ එම අරමුදලට රජය විසින් කළ දායකත්වය ඉහළ යාම හා සිය ආයෝජනයන් ගෙන් ලද වැඩි ආදායම් නිසා ආයෝජනය කළ හැකි වූ සම්පත් ප්‍රමාණයේ වැඩිවීමයි. නිදන් අරමුදල සඳහා රුපියල් දශ ලක්ෂ 3,561 ක් වූ රජයේ දායකත්වයෙහි පසුගිය වසරට වඩා දෙගුණයක පමණ වැඩිවීමක් පෙන්නුම් කෙරින. වසර තුළදී ලැබූ ආයෝජන ආදායම රුපියල් දශ ලක්ෂ 1,368 ක් වූ අතර, එය 1982 දී රුපියල් දශ ලක්ෂ 947 ක් විය. රුපියල් ණය සඳහා නිදන් අරමුදලක් පවත්වා ගැනීම නතර කිරීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම නිසා 1984 ජනවාරි මාසයට පෙර නිකුත් කරන ලද ණය සඳහා මෙන්ම අළුතින් නිකුත් කරන සුරැකුම්පත් ණය සඳහා ද ඒවා ආපසු ගෙවීම් වෙනුවෙන් නිදන් අරමුදලට දායකත්වයන් ගෙවීමට 1984 ජනවාරි මස සිටම රජයට අවශ්‍ය නොවේ. නිදන් අරමුදල විසින්, රුපියල් ණය සඳහා දායක වීම මගින් අයවැය කටයුතු සඳහා ද, නාගරික සංවර්ධන අධිකාරියේ සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ණයකර සඳහා දායක වීම මගින් රජයේ සම්පත් ඒවායේ කටයුතු සඳහා ද යොමු කිරීමට යෙදුන බව මෙම ගිණුම් ක්‍රමය තුළ සැහවිය යුතු කරුණක් නොවේ. මෙ-මගින් රජයේ වියදම්වල මෙන්ම නො පියවූ දළ දේශීය ණයවලද ප්‍රසාරණයක් ඇති කරන ලදී.

1983 දී රුපියල් ණය සඳහා සේවක අර්ථ සාධක අරමුදලෙහි දායකත්වය රුපියල් දශ ලක්ෂ 2,355 ක් වූ අතර, එය 1982 ට වඩා සියයට 66 ක තියුණු වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සාමාජික දායකත්වයන් සහ ආයෝජන ආදායම් වෙතින් ලද අතිරේක සම්පත් ප්‍රමාණයයි. 1983 සාමාජික දායක මුදල් ලැබීම් රුපියල් දශ ලක්ෂ 1,226 ක් වූ අතර, ආයෝජන ආදායම් රුපියල් දශ ලක්ෂ 926 ක් විය.

## දේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

* දළ දේශීය ණයවලින් නිදන් අරමුදල් අඩුකල පසු.
1983 සංඛ්‍යා තාවකාලිකය.

1983 දී රුපියල් දශ ලක්ෂ 2,300 ක් වූ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි දායකත්වය පෙර වසරට වඩා සියයට 2 ක අඩුවීමක් පෙන්නුම් කරනු ලැබින. එම අඩුවීමට හේතු වූයේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි ඉතුරුම් සංචලනය පෙර වසරට වඩා සියයට 18 කින් පහත වැටීමය. 1983 දී ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි ඉතුරුම් සංචලනය රුපියල් දශ ලක්ෂ 1,836 ක් වූ අතර, 1982 දී එය රුපියල් දශ ලක්ෂ 2,234 ක් විය. තවද, වසර තුළදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි කල් පිරුණු ආයෝජනයන් මත ආපසු ලැබුණු රුපියල් දශ ලක්ෂ 550 ක මුදලක් නැවත ආයෝජනය කිරීමක් ද රුපියල් ණය සඳහා කළ දායකත්වයෙහි ඇතුළත් විය.

වාණිජ බැංකු වෙතින් ලද රුපියල් දශ ලක්ෂ 415 ක් ද ඇතුළත්ව වෙනත් මූලයන්ගෙන් ලද දායකත්වය රුපියල් දශ ලක්ෂ 496 ක් විය. රුපියල් දශ ලක්ෂ 415 ක මුදල මහජන බැංකුව වෙතින් ලැබුනකි. එය ජාතික පේෂකර්ම සංස්ථාව විසින් මහජන බැංකුවට ගෙවිය යුතු වූ ණයක් රජය විසින් ගෙවා දැමීමත්, එයට සමාන මුදලක් බැංකුව විසින් රජයට ආපසු මාරු කිරීමත් හා සම්බන්ධ විය.

වර්ෂය තුළදී රජය විසින් 1983 ජූලි මස සිට බලපැවැත්වෙන පරිදි රුපියල් සුරකුම්පත් නිකුත් කිරීම හා අදාළ කොන්දේසිවල සංශෝධනයක් කරන ලදී. වාර්ෂික පොළී අනුපාතය සියයට 16 සිට සියයට 14 දක්වා අඩු කළ අතර, කල්පිරීමේ කාලය අවුරුදු 3 සිට අවුරුදු 5 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව, තුන් අවුරුදු කල්පිරීමේ කාලසීමාවකින් යුතු වාර්ෂික පොළිය සියයට 16 ක් වූ රුපියල් සුරකුම්පත් රුපියල් දශ ලක්ෂ 4,250 ක් 1983 මුල් භාගයේදී නිකුත් කරන ලද අතර, දෙවැනි භාගයේදී පස් අවුරුදු කල් පිරීමේ කාලසීමාවකින් යුතු වාර්ෂික පොළිය සියයට 14 ක් වූ රුපියල් දශ ලක්ෂ 3,523 ක් වටිනා සුරකුම්පත් නිකුත් කරන ලදී. මහජන බැංකුවට නිකුත් කරන ලද රුපියල් සුරකුම්පත් විශේෂිත ස්වභාවයක් ඉසිලූ අතර, එයට අදළ කල්පිරීමේ කාලසීමාව අවුරුදු 10 ක් සහ වාර්ෂික පොළිය සියයට 12 ක් විය. වසර තුළදී කල්-පිරුණු රුපියල් ණය 20 ක් වෙනුවෙන් 1983 දී රුපියල් ණය සම්බන්ධ මුළු ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,035 ක් විය.

වසර තුළදී භාණ්ඩාගාර බිල්පත් මත අතිරේක ලැබීම් රුපියල් දශ ලක්ෂ 80 ක් වූ අතර, ඉකුත් වසරේදී එය රුපියල් දශ ලක්ෂ 3,400 ක් විය. ඒ අනුව, 1983 වසර අවසානයේදී නො-පියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 17,400 ක් විය. වසර තුළදී භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ සීමාව රුපියල් දශ ලක්ෂ 23,000 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. වාර්ෂික පොළී අනුපාතය සියයට 13 සිට සියයට 12 දක්වා අඩු කරන ලදී. බැංකු අංශය විසින් දරණු ලැබූ භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රමාණය 1982 දී රුපියල් දශ ලක්ෂ 17,173 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 17,265 ක් දක්වා වැඩි විය. මෙයින් මහ බැංකුවේ දැරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 664 කින් රුපියල් දශ ලක්ෂ 17,257 ක් දක්වා වැඩිවූ අතර, වසර අවසානයේදී වාණිජ බැංකු වෙනුවෙන් වූ නොපියවූ වගකීම් රුපියල් දශ ලක්ෂ 8 ක ඉතා සුළු ප්‍රමාණයක් වෙමින් එහි දැරීම රුපියල් දශ ලක්ෂ 572 කින් පහත වැටුණි. බැංකු නොවන අංශයේ දැරීම්, පෙර වසරේ ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 12 කින් අඩු වූ අතර, 1983 වසර අවසානයේදී එම දැරීම් රුපියල් දශ ලක්ෂ 135 ක් විය.

මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය යටතේ මහ බැංකුව විසින් රජයට දෙන ලද තාවකා-ලික අත්තිකාරම් ප්‍රමාණය , 1982 දී රුපියල් දශ ලක්ෂ 604 ට සාපේක්ෂව 1983 දී රුපියල් දශ ලක්ෂ 377 කින් වැඩි විය. වසර තුළදී රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට දායකත්වයන් ගෙවීම සඳහා රුපියල් දශ ලක්ෂ 277 ක විශේෂ මහ බැංකු අත්තිකාරමක් ලබා ගන්නා ලදී. 1983 වසර අවසානයේදී මහ බැංකු අත්තිකාරම් මත නොපියවූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,794 ක් විය. විශේෂ ණය වශයෙන් 1980 දී ලබාගත් රුපියල් දශ ලක්ෂ 308 ක්

සහ වසර තුළදී ලබා ගත් රුපියල් දශ ලක්ෂ 277 ක් ද එහි ඇතුළත් වේ. නොපියවූ බඳු සංචිත සහතික පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10.7 සිට වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 9.9 දක්වා පහත වැටුණි. වසර තුළදී, රුපියල් 159,900 ක නව සහතික නිකුත් කරන ලද අතර, රුපියල් 869,589 ක් වටිනා සහතික වෙනුවෙන් ආපසු ගෙවීම් කරන ලදී. නොපියවූ විදේශීය පරිපාලන ණය 1982 දී රුපියල් දශ ලක්ෂ 304 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 196 ක් දක්වා පහත වැටුණි. වසර තුළදී පරිපාලන ණය මත දළ ලැබීම් රුපියල් දශ ලක්ෂ 11 ක් වූ අතර, ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 146 ක් විය.

පසුගිය වසරේ සියයට 19 ක වැඩිවීම සමඟ සසඳන කල, සියයට 33 ක වැඩිවීමක් වාර්තා කරමින් 1983 අවසානය වනවිට නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 46,025 ක් විය. වෙනත් ව්‍යවහාර මුදල්වලට අනුව ශ්‍රී ලංකා රුපියලෙහි අගය හීනවීම නිසා 1983 දී නොපියවූ වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,254 කින් වැඩි වීමට හේතු වූ අතර, 1982 දී එම වැඩිවීම රුපියල් දශ ලක්ෂ 440 ක් විය. වර්ෂය තුළදී ණය හිමියන් විසින් කපා හරින ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 26 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 18 ක් ව්‍යාපෘති ණය වෙනුවෙන් ද, ශේෂය භාණ්ඩ ණය වෙනුවෙන් ද විය. මෙය, 1982 වසරේ කපා හරින ලද රුපියල් දශ ලක්ෂ 43 සමඟ සැසඳේ.

පහත දැක්වෙන 1.49 සංඛ්‍යා සටහනෙන් පෙන්වන අයුරු ව්‍යාපෘති ණය, භාණ්ඩ ණය සහ වෙනත් ණයවලින් සමන්විත විදේශීය ණය යටතේ 1983 දී මුළු ලැබීම් රුපියල් දශ ලක්ෂ 7,364 ක් වූ අතර, ඉකුත් වසරේදී එය රුපියල් දශ ලක්ෂ 5,701 ක් විය. ව්‍යාපෘති ණය රුපියල් දශ ලක්ෂ 5,290 ක් වූ අතර, භාණ්ඩ ණය හා මුදල් ණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,467 ක් හා රුපියල් දශ ලක්ෂ 607 ක් විය. මුදල් ණය අමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 25 ක් වටිනා යූරෝ මුදල් ණයකින් සමන්විත විය. ණය ආපසු ගෙවීම් සඳහා ගැලපුම් කළ පසු විදේශීය ණය යටතේ ශුද්ධ ලැබීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6,199 ක් වූ අතර, පසුගිය වසරේදී එය රුපියල් දශ ලක්ෂ 5,027 ක් විය. වර්ෂය තුළදී රජය විසින් ව්‍යාපෘති ණය ගිවිසුම් 20 ක් සහ භාණ්ඩ ණය ගිවිසුම් 3 ක් ද ඇතිකර ගන්නා ලදී. 1983 දෙසැම්බර් 31 වන දිනට පැවති විනිමය අනුපාතයන්ට අනුව මෙම ණය ගිවිසුම්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 5,497 ක් වන අතර, පසුගිය වසරේ ගිවිස ගන්නා ලද ණයවල මෙම වටිනාකම රුපියල් දශ ලක්ෂ 11,448 ක් විය.

**1 . 49 සංඛ්‍යා සටහන**


**විදේශීය ණය සඳහා ප්‍රධාන දයකයින් — 1983**

රුපියල් දශ ලක්ෂ

| | ව්‍යාපෘති ණය | භාණ්ඩ ණය | අනිකුත් ණය |
|---|---|---|---|
| කැනඩාව .. .. | 417·5 | — | — |
| ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුව .. .. | 1,043·1 | — | — |
| ජා: සං: සංගමය .. .. | 1,474·0 | — | — |
| ආසියානු සංවර්ධන බැංකුව .. | 432·7 | — | — |
| ඇ: එ: ජ: .. .. | 648·6 | 408·8 | — |
| ජපානය .. .. | 397·3 | 339·5 | — |
| ස්කැන්ඩිනේවිස්කා එන්ස්කිල්ඩා බැන්කන්ස්—ස්වීඩනය | 272·3 | — | — |
| මැනුපැක්චරර්ස් හැනෝවර් ට්‍රස්ට් සමාගම .. | 233·2 | — | — |
| ප්‍රංශය .. .. | — | 271·2 | — |
| යූරෝ මුදල් .. .. | — | — | 606·6 |
| වෙනත් .. .. | 371·8 | 447·5 | — |
| මුළු දළ ලැබීම් .. .. | 5,290·5 | 1,467·0 | 606·6 |
| ආපසු ගෙවීම් .. .. | 261·8 | 522·2 | 380·7 |
| ශුද්ධ ලැබීම් .. .. | 5,028·7 | 944·8 | 225·9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

# විදේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

**1978 සිට වෙනත් ණයවල ජා. මූ. අරමුදලෙන් ලද භාරකාර අරමුදල් ණය ඇතුලත්ය.**
**1983 සංඛ්‍යා තාවකාලිකය.**

1983 දී රාජ්‍ය ණයමත පොළී ගෙවීම්, රුපියල් දශ ලක්ෂ 5,314 ක් දේශීය ණය මත පොළී ගෙවීම්වලින් ද, රුපියල් දශ ලක්ෂ 1,279 ක් විදේශීය ණය මත පොළී ගෙවීම්වලින් ද සමන්විත විය. වසර තුළදී දේශීය ණය මත පොළී ගෙවීම් පසුගිය වසරට වඩා සියයට 27 කින් වැඩි වූ අතර, විදේශීය ණය මත ගෙවීම් සියයට 40 කින් ඉහළ නැගුණි. දේශීය ණය මත පොළී ගෙවීම්, රුපියල් ණය සඳහා රුපියල් දශ ලක්ෂ 3,228 කින් ද, භාණ්ඩාගාර බිල්පත් මත රුපියල් දශ ලක්ෂ 2,082 කින් ද, විදේශීය පරිපාලන ණය මත රුපියල් දශ ලක්ෂ 3 කින් ද සමන්විත විය. රුපියල් ණය සඳහා පොළී ගෙවීම් පසුගිය වසරට වඩා සියයට 49 ක වැඩිවීමක් වාර්තා කළ අතර, භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළී ගෙවීම් සියයට 4 කින් වැඩි විය. පරිපාලන ණය මත පොළී ගෙවීම් නොවෙනස්ව පැවතුණි. විදේශීය ණය සඳහා පොළී ගෙවීම්, ව්‍යාපෘති ණය සඳහා රුපියල් දශ ලක්ෂ 299 කින් ද, භාණ්ඩ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 441 කින් හා වෙනත් ණය සඳහා රුපියල් දශ ලක්ෂ 539 කින් ද සමන්විත විය. ව්‍යාපෘති ණය සහ භාණ්ඩ ණය මත පොළී ගෙවීම් පිළිවෙලින් සියයට 39 කින් සහ සියයට 27 කින් වැඩිවූ අතර, වෙනත් ණය මත පොළී ගෙවීම් පසුගිය වසරට වඩා සියයට 53 කින් ඉහළ නැගුණි. වෙනත් ණය යටතේ වූ යූරෝ මුදල් ණය සඳහා මුළු පොළී ගෙවීම් 1983 දී රුපියල් දශ ලක්ෂ 497 ක් වූ අතර, 1982 දී රුපියල් දශ ලක්ෂ 344 ක් ද, 1981 දී රුපියල් දශ ලක්ෂ 252 ක් ද සහ 1980 දී රුපියල් දශ ලක්ෂ 4 ක් ද විය. යූරෝ මුදල් වෙළෙඳ ණය ගිවිසුම් 3 ක් මත එම ණය ලබා ගන්නා ලදී. පළමු ණය මුදල වූ අමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 50, 1980 දී ලබාගත් අතර,එයට අදාළ පොළී අනුපාතය ණය ආපසු ගෙවීම් සඳහා ඉඩ දෙන ලද සිව් වසරක සහන කාලය සඳහා ලන්ඩන් අන්තර් බැංකුවල බලපවත්වන ලද අනුපාතය (ල.අ.බැං.අ.) සහ සියයට 0.875 ක්ද, ඉතිරි සිව් වසර සඳහා ල.අ.බැං.අ. සහ සියයට 1 ක් ද වේ. 1981 දී ලබාගන්නා ලද අමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 75 ක් වූ දෙවැනි ණය සඳහා පොළිය පළමු අවුරුදු හය සඳහා ල.අ.බැං.අ. සහ සියයට 0.625 ක් ද, ඉතිරි අවුරුදු දෙක සඳහා ල.අ.බැං.අ. සහ සියයට 0.75 ක් ද වේ. මෙම ණය ආපසු ගෙවීම සඳහා දෙන ලද සහන කාලසීමාව අවුරුදු 5 කි. 1982 දී ගිවිස ගන්නා ලද අමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 100 ක් වටිනා තුන්වැනි ණය මුදල 1982 සහ 1983 වර්ෂවලදී කොටස් වශයෙන් ලබා ගන්නා ලදී. මෙම ණය සඳහා පොළිය පළමු අවුරුදු 2 සඳහා ල.අ.බැං.අ. සහ සියයට 0.5 ක්ද, ඉතිරි අවුරුදු 6 සඳහා ල.අ.බැං.අ. සහ සියයට 0.625 ක්ද වේ. මෙම ණය මුදල ආපසු ගෙවීම සඳහා දෙන ලද සහන කාලසීමාව අවුරුදු 5 කි. ලබා නො ගත් ණය ප්‍රමාණයන් වෙනුවෙන් ගෙවිය යුතු බැඳීම් ගාස්තුව පළමුවැනි සහ දෙවැනි ණය සඳහා සියයට 0.5 ක් වූ අතර, තුන්වැනි ණය සඳහා සියයට 0.375 ක් විය. ජපානයේ යෙන් ණය මුදල සඳහා පොළී ගෙවීම් 1983 දී රුපියල් දශ ලක්ෂ 29 ක් වූ අතර, 1982 දී එය රුපියල් දශ ලක්ෂ 0.3 ක් විය. මෙම ණය සඳහා වාර්ෂික පොළී අනුපාතය සියයට 9.4 ක් වූ අතර, පස් අවුරුදු සහන කාලසීමාව ද ඇතුළත්ව ණය ආපසු ගෙවීමේ කාලය අවුරුදු 15 ක් වේ.

## මුදල් සහ බැංකු කටයුතු

### මුදල් සැපයුම

1983 වර්ෂයේදී ආසන්න මුදල් හි පහත් වර්ධන වේගයත් සමග එක් වූ පුළුල් මුදල් සැපයුමෙහි ($M_2$) වර්ධනයක් දක්නට ලැබුණි. පටු මුදල් සැපයුම ($M_1$) මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත වන අතර, ආසන්න මුදල්හි වෙළෙඳ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු ඇතුළත් වේ. 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 1,735 ක හෙවත් සියයට 17 ක වැඩිවීමක් හා සසඳන විට වර්ෂය තුළදී $M_1$ රුපියල් දශ ලක්ෂ 2,988 කින් හෙවත් සියයට 25 කින් වැඩිවූ අතර, 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 4,328 ක හෙවත් සියයට 30 ක වර්ධනය හා සසඳන කල, ආසන්න මුදල් රුපියල් දශ ලක්ෂ 3,759 කින් හෙවත් සියයට 20 කින් වර්ධනය විය. වෙළෙඳ බැංකු විසින් තැන්පතු පොළී අනුපාතිකයන් පහළ දැමීම හේතුකොට ගෙන අනෙකුත් තැන්පතු රාශීකරණ ආයතන කරා තැන්පතු ගලා යාම ආසන්න මුදල්හි වර්ධන අනුපාතය අඩුවන්නට තරමක් දුරට හේතු විය. 1982 වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 6,063 ක හෙවත් සියයට 25 ක වර්ධනය හා සසඳන විට පටු මුදල් සැපයුම